අස්වුණා ද? අස් කළා ද?

ගුවන් සේවා අමාත්‍යාංශය සහ පෞද්ගලික සමාගමක් අතර සිදුවූ ගනුදෙනුවකදී අල්ලස් ඉල්ලා ඇති බවට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස විසින් ජූලි 05, 2022 දින පාර්ලිමේන්තුවේදී සිදු කළ චෝදනාව අනුව, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා, ජූලි 06, 2022 දින ධූරයෙන් ඉවත් වීම පිළිබඳව මාධ්‍ය අවධානය යොමු වී තිබිණි.

එහිදී, එකිනෙකට ප්‍රතිවිරුද්ධ තොරතුරු සිංහල භාෂා පුවත්පත් (ජූලි 07, 2022) තුළ පළව තිබිණි. ඒ මෙසේයි.

"දූෂණයට එරෙහිව ජනපති ක්‍රියාත්මක වෙයි, නිමල්ට ඇමැති කමෙන් යන්න කියයි" (ජනපති විසින් ඇමතිට පරීක්ෂණ නිම වන තුරු ධූරයෙන් ඉවත් වන්නැයි දැනුම් දුන් බව වාර්තා කරයි.) - මව්බිම

"අක්‍රමිකතා පරීක්ෂණයට ඉඩදී ඇමති පුටුවෙන් නිමල් ඉවත් වෙයි" (පරීක්ෂණය නියමාකාරයෙන් කිරීමට අවස්ථාව සලසා දීමේ අරමුණින් ජනපතිට ලිපියක් යවා ධූරයෙන් ඉවත් වී ඇති බව වාර්තා කරයි.) - ලංකාදීප

මේ අනුව, ඔබ තෝරාගන්නේ කුමන පුවතද?